(සියළුම හිමිකම් ඇවිරිණි)

00033

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (1)

## මූල්‍ය ක්‍රම (12)

කාලය පැය 03 යි.

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01 (අ) ඒකාබද්ධ අරමුදල සමන්විත වී ඇති ආකාරය හා ඒ යටතේ වියදම් දැරීම පිළිබඳව මුදල් රෙගුලාසි යටතේ සලසා ඇති විධිවිධාන කවරේදැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ආ) රජයේ අත්තිකාරම් ගිණුම් කටයුතු වලට අදාලව පහත සඳහන් දෑ කෙටියෙන් විස්තර කරන්න.

i. වියදම් පිළිබඳ උපරිම සීමාව

ii. හර ශේෂ පිළිබඳ උපරිම සීමාව (ලකුණු 10)

02 (අ) 2013 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ඇස්තමේන්තු යටතේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් දැරීමට රජයේ ණය ආපසු ගෙවීමට ප්‍රතිපාදන සලසා ඇති ආකාරය සහ එම වියදම් හා වගකීම් පියවා ගැනීමට ආදායම හා ණය උපයෝගී කර ගෙන ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ආ) රජයේ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමට අදාලව පහත සඳහන් දෙපාර්තමේන්තු වල කාර්යභාරය කෙටියෙන් දක්වන්න.

i ජාතික අයවැය දෙපාර්තමේන්තුව (ලකුණු 05)

ii රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (ලකුණු 03)

iii ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව (ලකුණු 02)

03 "ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් තමා යටතේ ඇති දෙපාර්තමේන්තු වල මූල්‍ය පාලනය පිළිබඳව මුදල් අමාත්‍යවරයාට වගකිව යුතුය". මු.රෙ.127 ඇසුරින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 20)

04 "රජයේ වියදම් මනා පාලනයකට යටත් කර ඇත". මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 20)

05 (අ) නිල බැංකු ගිණුමක් විවෘත කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය මු.රෙ.381 ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ආ) වලංගු කාලය ඉක්මව වූ චෙක්පත් පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ගය මු.රෙ.396 ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

06 (අ) විවිධ ප්‍රසම්පාදන කමිටු නම් කරන්න. (ලකුණු 05)

(ආ) විවිධ ප්‍රසම්පාදන ක්‍රම නම් කරන්න. (ලකුණු 05)

(ඇ) ලංසු බැඳුම්කර (Bid Bond) ලබා ගැනීමේ අවශ්‍යතාවය කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ඈ) විවිධ ප්‍රසම්පාදන ක්‍රම යටතේ ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබා දිය යුතු අවම කාල සීමාව වෙන වෙනම දක්වන්න. (ලකුණු 05)

****************